(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 179.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 අප්‍රේල් මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1167/'11

1.

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේදී අයි. ඕ. සී. (IOC) නමැති ඉන්දියානු සමාගමට බදු නිදහස් පදනමින් ඉන්ධන පිරවුම් හල් 100 ක් ලබා දී තිබේද;

(ii) එම ඉන්ධන පිරවුම්හල්වලින් රජයට බදු ගෙවිය යුතු වන්නේද;

(iii) එසේ නම්, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවලදී රජයට ගෙවන ලද බදු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්ධන පිරවුම්හල්වලින් ගෙවීම පැහැර හරින ලද බදු රජයට ගෙවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අයි. ඕ. සී. සමාගම වෙත දන්වා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සමාගම බදු ගෙවිය යුතු නැති බව ආයෝජන මණ්ඩල සභාපතිවරයා විසින්ම නැවත අදාළ සමාගමට දන්වා තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එවැනි දැනුම්දීමක් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයි. ඕ. සී. සමාගම රජයට ගෙවිය යුතු බදු නොගෙවා පැහැර හැරීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1549/'11

2.

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයෙන් පසුව ඒ-9 මාර්ගය යළි ඉදිකිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඉහත සඳහන් ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය සහ ව්‍යාපෘතිය අවසන් කරන අවස්ථාව වන විට තථ්‍ය පිරිවැය කොපමණද; සහ

(iv) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ-9 මාර්ගය යළි ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවය සඳහා යොදවන ලද විදේශීය හා දේශීය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය සේවකයන් ශ්‍රී ලංකාවට රැගෙන එන ලද රට හෝ සමාගම විසින් ඔවුන්ට ලබාදී තිබූ තනතුරු නාමයන් කවරේද; සහ

(iii) ඒ-9 මාර්ගය යළි ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1588/'11

3\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රදේශයේ පිහිටි බදුරලිය මධ්‍යම පේල් ක්‍රේප් රබර් කර්මාන්තශාලාව වර්ෂ විස්සක පමණ කාලයක සිට වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කර්මාන්තශාලාවේ සම්පත් විනාශවීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බව පිළිගන්නේද;

(ii) එම ක්‍රේප් රබර් කර්මාන්තශාලාව විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, එම කර්මාන්තශාලාව වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1612/'11

4\.

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යාපනය මහනගර සභාවේ නගරාධිපති, සභාවේ අනුමතියකින් තොරව අත්තනෝමතික තීරණ ගනිමින්, යාපනය නගරයේ වගුරුබිමක සිව්මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට අනුමතිය ලබාදී ඇති බවත්;

(ii) යාපනයේ හිටපු පුරපති දිවංගත රවිරාජ් මහතා එම වගුරුබිමෙහි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කළ යෝජනාවක් පස් පිළිබඳ සිදු කළ ශක්‍යතා වාර්තාවේ නිර්දේශ හේතුවෙන් ක්‍රියාත්මක නොකළ බවත්;

(iii) කිසිදු පස් පරීක්ෂාවකින් තොරව එම වගුරුබිමෙහි මේ වන විට සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන බවත්;

(iv) එම ඉදිකිරීම පසුකාලීනව ජීවිත හා දේපළ හානි සිදුවීමට හේතුවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමටත් පෙර ඉදිකිරීම්කරු කඩ කාමර කිහිපයක් විකුණා ඇති බවත්;

(ii) එහිදී රු. 19,000,000කට විකුණනු ලැබූ කඩ කාමරවලට රු. 11,000,000කට පමණක් ඔප්පු ලියා අත්තිකාරම් වශයෙන් රු. 50,000 බැගින් ලබාගෙන ඇති බවත්;

(iii) එමගින් මහනගර සභාවට ආදායම අහිමිවීමක් හා ආදායම් බදු වංචාවක් සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත තත්ත්වය වැළැක්වීමට මූලික පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1714/'11

5\. ගරු තිස්ස අත්තනායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සේවිකාවන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලියක් වරාය අධිකාරියේ චක්‍රලේඛ අංක 03/2011 යටතේ නිකුත්කර ඇති බවත්;

(ii) එම චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වර්ෂ දහයක අවම සේවා කාලයක් සපුරා ඇති ඉදිරියට වර්ෂ පහක් සේවය කිරීමට ඇති සේවකයින්ට රුපියල් ලක්ෂ විස්සක උපරිමයට යටත්ව අදාළ වන්දි මුදල් ලබාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කොළඹ වරාය පුළුල් කිරීම, හම්බන්තොට නව වරාය ඉදි කිරීම සහ සෙසු වරායවල් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරමින් සිටියදී වරාය සේවකයින් විශ්‍රාම ගැන්වීමට පියවර ගනු ලබන පදනම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය කාලසීමාව තුළ දේශපාලන බලපෑම් මත සිදු කළ අත්‍යවශ්‍ය නොවන බඳවා ගැනීම හේතුවෙන් වරාය අධිකාරියේ සේවක අතිරික්තයක් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1726/'11

6\. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතනය සතු අනෙකුත් දේපල කවරේද;

(iii) එම දේපලවල ප්‍රමාණයන් කවරේද;

(iv) මේ වන විට හිඟුරාණ සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම වගා බිම් ප්‍රමාණයෙන්, ආයතනය විසින් වගාකළ සහ ගොවියන් විසින් වගාකළ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වගා කරන ලද උක් දඬු එම කර්මාන්තශාලාව විසින් මිලදී ගන්නේද;

(ii) එසේ නම්, උක් දඬු ටොන් එකක මිල කොපමණද;

(iii) කර්මාන්තශාලාව විසින් මිලදී නොගන්නේ නම්, කර්මාන්තශාලාවේ හා ගොවියන්ගේ උක් දඬු මිලදී ගනු ලබන ආයතනය කුමක්ද;

(iv) එම ආයතනය උක් දඬු ටොන් එකක් වෙනුවෙන් ගෙවන මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාවේ උක් ඇඹරීමටත්, සීනි නිෂ්පාදනය කිරීමටත් බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/'11

7. ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේදී කොරියානු රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දීමට ගිවිසුම්ගත රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා කොරියාවෙන් මෙරටට ගෙන්වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) මුල් අවස්ථාවේදී බෙදා දුන් ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) ගෙන්වන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව ඉල්ලුම්කරුවන්හට ලබා දීමට ප්‍රමාණවත් වූයේද;

(v) නොඑසේ නම්, නැවත කොරියාවෙන් ඉල්ලුම්පත් මෙරටට ගෙන්වූයේද;

(vi) අමතරව අවශ්‍යවූ එම ඉල්ලුම්පත් මෙරටදී මුද්‍රණය කළේ නම්, ඒවා මුද්‍රණය කළ ආයතනය කුමක්ද;

(vii) එම ආයතනය රාජ්‍ය ආයතනයක් නොවේ නම්, එහි අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කොරියාවේ රැකියා අවස්ථාවන් සඳහා බඳවා ගන්නා ක්‍රියාපටිපාටිය කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2006/'11

8. ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, කළුගඟ අවට ඇති ප්‍රදේශවල ගංවතුර නිසා සිදුවන ආපදා කළමනාකරණය සඳහා දැනට ගෙන ඇති,

(i) කෙටිකාලීන පියවර කවරේද;

(ii) දිගුකාලීන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/’11

9\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ අවිධිමත් හා අනියම් ක්‍රම මගින් කාන්තාවන් හා කුඩා ළමුන් ගෘහ සේවය, ළමුන් රැකබලා ගැනීම හා ගෙවතු නඩත්තුව ආදී රැකියා සඳහා යොදවන බවත්;

(ii) එසේ සේවයේ යෙදෙන කුඩා ළමුන් හා කාන්තාවන් බොහෝවිට නොයෙකුත් වද හිංසාවලට භාජනය වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි ළමුන් සහ කාන්තාවන් වද හිංසාවලට ලක්වීම තුරන් කිරීම සඳහාත්, සේවක හා සේව්‍ය යන දෙපාර්ශ්වයටම යහපතක් වීම සඳහාත්, ඉහත සඳහන් රැකියා අපේක්ෂිත අයට ලියාපදිංචි විය හැකි විධිමත් ක්‍රමවේදයක් සහිත ආයතනයක් පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) පිහිටුවන ලද එවැනි ආයතනයක ලියාපදිංචි පුද්ගලයින් පමණක් ඉහත (අ) (i) හි සඳහන් රැකියා සඳහා විධිමත්ව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2032/’11

10\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2600 වැනි ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් ‘‘පින්බර ලංකා’’ බෞද්ධ ප්‍රදර්ශනයක් හා ඊට සමගාමීව බෞද්ධ නිර්මාණ තරඟාවලියක් පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඊට අදාළව වැය කළ රාජ්‍ය අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් වැය කරන ලද ආකාරය පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත (අ) හි සඳහන් කටයුතු සඳහා පෞද්ගලික අංශයෙන් ආධාර ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ආධාර ලබාගත් ආයතන සහ එම ආයතන වෙතින් ලැබූ ආධාර ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2084/’11

11\.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ‘‘සද්ධාතිස්ස වැව’’ ව්‍යාපාර යටතේ ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම් ලබාදුන් බවත්;

(ii) එහිදී 54 දෙනෙකුට ඉඩම් අක්කර 1½ බැගින් ද, 275 දෙනෙකුට ඉඩම් අක්කරය බැගින්ද ලබාදී ඇති බවත්;

(iii) අක්කර 1½ බැගින් ලබා දුන් 54 දෙනා හට මෙම ව්‍යාපාරයේ හොඳම ඉඩම් කට්ටි ලබා දී ඇති බවත්;

(iv) මේ හේතුවෙන් අක්කරය බැගින් ඉඩම් ලැබූ 275 දෙනාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවත්;

(v) මෙම ඉඩම් කච්චේරිය මගින් ඉඩම් ලබාදීමේ දී අදාළ නිලධාරීන් පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි අසාධාරණයට ලක්වූ 275 දෙනා හට සම අයිතිවාසිකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) වැරදි සහගත අයුරින් ක්‍රියාකළ නිලධාරීන්හට දඬුවම් ලබාදීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2098/'11

12.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුවේ දකුණු පෙදෙසෙහි පිහිටි මරුදමුනෙෙ ගම්මානයේ ජනතාවට අධ්‍යාපන ආලෝකය ලබාදෙන අල්-මනාර් මධ්‍ය මහා විද්‍යාලය ශත වර්ෂයක් සම්පූර්ණ කර ඇති බවත්;

(ii) මෙම පාසල වාර්ෂිකව විශිෂ්ට අධ්‍යාපන ප්‍රතිඵල සහ කලා, සංස්කෘතික හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි විශිෂ්ට ප්‍රතිඵල ලබා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සියවසක් පුරා මෙම විදුහල මගින් ඉටුව ඇති යහපත් අධ්‍යාපන සේවය හා දෙමාපියන් හා ගුරුවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ඉල්ලීම සැලකිල්ලට ගෙන එම පාසල ජාතික පාසලක් වශයෙන් තත්ත්වයෙන් උසස් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2099/'11

13.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරක්ෂක හමුදාවල සේවය කරන රණවිරුවන්හට ඔවුන්ගේ තුන්වැනි දරුවා ඉපදුන විට රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීමට 2011 අයවැයෙන් කළ යෝජනාව ක්‍රියාත්මක කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම දීමනාව ලබා දෙනු ලබන ආරක්ෂක හමුදා නිලයන් කවරේද;

(iii) එය ලබා දීමේදී සක්‍රීය සේවය සැලකිල්ලට ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරීත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකිණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරීත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

ටී. බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**